Embassy of the United States of America

Colombo

# PHOTO RELEASE

Public Affairs Section

Tel: +94 (1) 249-8100 ● Fax: +94 (1) 244-9070

Email: shenjy@state.gov ● http://srilanka.usembassy.gov

Release No. 20160617

**ජගත් ව්‍යවසායකයින්ගේ සමුළුවට ශ්‍රී ලංකාවෙන් ශක්තිමත් නියෝජිත පිරිසක්**

ජුනි 17, 2016: ඇමෙරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියා හි ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ පැවැත්වීමට නියමිත 2016 ජගත් ව්‍යවසායකයින්ගේ සමුළුවට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වීමට යසිසුරි පෞද්ගලික සමාගමේ නිර්මාතෘ සහ මෝස්තර නිර්මාණ ශිල්පිනී, යසිසුරි කිරිබණ්ඩාර ඇතුළු තවත් දේශීය ව්‍යවසායකයින් සිව් දෙනෙකු, ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය මඟින් තෝරාගෙන ඇත. ඇමෙරිකාවේ සිලිකන් වැලි (Silicon Valley) හි ප්‍රධාන ව්‍යවසායකයින් සහ විධායක නිලධාරීන් හට ලොව වටා වෙසෙන ව්‍යවසායකයින් සමඟ අත්දැකීම් සහ අදහස් හුවමාරු කරගැනීමට මෙම සමුළුව වැදගත් වෙයි.

"කාන්තාවන් දියුණු වන විට මුළුමහත් රටක් දියුණු කළ හැකි," යැයි එක්සත් ජනපද තානාපති අතුල් කෙශප් පවසන අතර එවැනි අවස්ථාවන් වර්ධනය කිරීම සඳහා කාන්තා ව්‍යවසායකයන් වැදගත් කාර්යභාරයක් ඉටු කරන බව සඳහන් කරයි.



එක්සත් ජනපද ජනපති බැරැක් ඔබාමා විසින් 2010 වර්ෂයේදී ආරම්භ කරන ලද ජගත් ව්‍යවසායකයින්ගේ සමුළුවට, මේ වර්ෂයේදී රටවල් 170ක් නියෝජනය කරමින් ව්‍යවසායකයින් 700 පමණ සහභාගී වීමට නියමිතය. කිරිබණ්ඩාර ට අමතරව මෙම සමුළුවට සහභාගී වන අනෙක් ශ්‍රී ලාංකිකයින් වන්නේ රිලයන්ස් නෙට්වර්ක්ස් අධ්‍යක්ෂක තෝබියස් වසන්ත් කුමාර්, ජනමාධ්‍ය ව්‍යවසායක සුහේල් හිෂාම්, බයිට්ස්රක් හොස්ටින් අධ්‍යක්ෂක මාර්කස් රණවීරගේ සහ ඩබල් ඩී ප්‍රකාශන කළමනාකාර අධ්‍යක්ෂක/ සංස්කාරක දිනුෂ්ක චන්ද්‍රසේන යි.

###

**Caption:** එක්සත් ජනපද තානාපති අතුල් කෙශප්, කොළඹ එක්සත් ජනපද කාර්යාලයේ අනුග්‍රාහකත්වයෙන් කැලිෆෝනියා හි ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ පැවැත්වීමට නියමිත 2016 ජගත් ව්‍යවසායකයින්ගේ සමුළුවට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වන යසිසුරි කිරිබණ්ඩාරට සුභ පතමින්.